# පරිසර කළමනාකරණය පිළිබඳව ත්‍රිපිටකාගත සූත්‍ර ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

(තෝරාගත් සූත්‍ර කිහිපයක් ඇසුරින්)

*කේ.ඩබ්ලිව්.ඩී. නුජිත*[1]

පරිසරය යනු අහස, ජලය, වාතය හා පොළොව ආදි ස්වාභාවික සම්පත් හා ශක්තීන්ගෙන් සමන්විත වූවෙකි. මිනිසාට බෙහෙවින් ම බලපාන සාධකයක් ලෙස පරිසරය දැක්විය හැකි ය. ඒ අනුව මිනිසා හා පරිසරය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් මැනවින් පවති. එමෙන් ම මිනිසාගේ හැසිරීම් රටාවන් පරිසරය කෙරෙහි ද පාරසරික ක්‍රියාවලියත් මිනිසා කෙරෙහි ද අන්‍යෝන්‍ය ලෙස බලපාන බවඅංගුත්තර නිකායේ අධම්මික සූත්‍රය මඟින් ප්‍රකට වේ. කෙසේ වෙතත් නූතන මිනිසා විද්‍යාත්මක ඥානයෙන් පෝෂණය වීමත් සමග ම පරිසරයට ප්‍රබල ලෙස බලපෑම් එල්ල කරයි. ඒ නිසා පරිසරය රැක ගැනීමට මිනිස්සු විවිධ ක්‍රියාමාර්ග ගනිති. මේ අනුව විවිධ බලපෑම් මගින් පරිසරය විනාශ වීමෙන් වලකා ගැනීම සඳහා බුදුන් වහන්සේ විසින් ප්‍රායෝගික වූ පරිසර කළමනාකරණ පද්ධතියක් සිය ශ්‍රාවකයාට පෙන්වා දී ඇත. ඒ බව හමුවන්නේ ත්‍රිපිටකය තුළනි. මේ අනුව මෙම පර්යේෂණයෙහි ගැටලුව වන්නේ ත්‍රිපිටකය තුළ බුදුන් වහන්සේ පෙන්වා දුන් පරිසර කළමනාකරණ පද්ධතිය ප්‍රකට වන්නේ කෙසේ ද යන්නයි. මේ අනුව මෙම පර්යේෂණයෙහි අරමුණ වන්නේ වත්මන් පාරසරික අර්බුදයන් අවම කිරීම සඳහා ත්‍රිපිටකයෙන් හෙළි වන පරිසර කළමනාකරණ පද්ධතිය අධ්‍යයනය කිරීමයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මූලික වසයෙන් සූත්‍ර පිටකය හා විනය පිටකය යන පිටක ග්‍රන්ථ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ගෙන එහි එන මෙම පර්යේෂණ ගැටලුව හා සම්බන්ධ දත්ත විශ්ලේෂණය කරමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. බෞද්ධ පරිසර කළමනාකරණ පද්ධතිය මූලික වසයෙන් මනස පාදක කරගෙන ක්‍රියාත්මක කෙරෙන පරිසර කළමනාකරණ පද්ධතියක් බවත්, වත්මන් පාරසරික අර්බුද ඇති වීමට හේතු වී ඇත්තේ මානව අකල්ප පරිසර හිතකාමී නොවන නිසා බවත් පරිසරය කෙසේ ද සාර්ථක ලෙස හිතකාමී ව කළමනාකරණය කල යුත්තේ යන්න බුදුන් වහන්සේ විසින් පෙන්වා දී ඇති ආකාරය අග්ගඤ්ඤ සූත්‍රය, සාමඤ්ඤඵල සූත්‍රය යනාදි සූත්‍ර මඟින් පෙන්වා දීම යනාදිය මෙම පර්යේෂණය මඟින් ප්‍රකට වන ප්‍රතිඵල වේ. වන විනාශය, ජල දූෂණය, වායු දූෂණය වැලකීම හා තුරුලතා රැක ගැනීමට වගේ ම ඒවායේ පෝෂණය කිරීම සඳහා ගත යුතු ප්‍රායෝගික ක්‍රියාමාර්ග රැසක් ත්‍රිපිටකය තුළින් උද්දීපනය වේ. එමෙන් ම බෞද්ධ පරිසර කළමනාකරණය සම්බන්ධ මානව ආකල්ප නූතන පරිසරවේදීන්ට හා අනෙකුත් සියලු ම දෙනාට නූතන පරිසර ගැටලු විසඳීම සඳහා ත්‍රිපිටකයෙන් ප්‍රකට වන පරිසර කළමනාකරණ පද්ධතිය බෙහෙවින් දායක කර ගත හැකි බව මෙම පර්යේෂණය මගින් පෙන්වා දිය හැකි වැදගත්කම ලෙස දැක්විය හැකි ය. මේ අනුව ත්‍රිපිටකයෙන් ප්‍රකට වන පරිසර කළමනාකරණ පද්ධතිය මඟින් වත්මන් පාරසරික අර්බුද අවම කර ගත හැකි බව මෙම පර්යේෂණය මඟින් මනා නිගමනයකට එළඹිය හැකි ය.

***ප්‍රමුඛ පද:*** කළමනාකරණය, ත්‍රිපිටකය, පරිසරය, බෞද්ධ, සූත්‍ර

[1] රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, nujithadulith@gmail.com